**ලංසු දැන්වීම**

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**විජය කුමාරතුංග අනුස්මරණ රෝහල**

**ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම-**

**2026/2027**

2026/2027 වර්ෂයක කාලයක් සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ පිරිසිදු කිරීමේ සේවය සැපයීම පිණිස ලියාපදිංචි ආයතනවලින් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

**1. මෙම කොන්ත්‍රාත්තුව සඳහා පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලිය යුතුය.**

I. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් ආඥා පනත යටතේ හෝ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිරිසිදු කිරීමේ සේවය සැපයීමේ ආයතනයක් ලෙස පුවත්පත් දැන්වීම පළ වූ දිනට අවම වශයෙන් වර්ෂයකට පෙර ලියාපදිංචි වූ ආයතනයක් විය යුතුය.

II. පොදු කොන්ත්‍රාත් පනතේ 08 වැනි වගන්තිය යටතේ වන ලියාපදිංචි සහතිකය (මුල් පිටපත)

III. වැට් බදු ගෙවන්නේ නම් පූර්වාසන්න තක්සේරු වර්ෂය සඳහා ආයතනය නමින් වැට් බදු/ආදායම් බදු ගෙවා ඇති බව ලිඛිත සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය. (සී/ස සමාගමක් නම් සමාගම නමින් ද, තනි පුද්ගල /හවුල් ව්‍යාපාර ආයතන සියළු හවුල්කරුවන්ගේ නමින් ද, පූර්වාසන්න වර්ෂය සඳහා ආදායම් බදු, වැට් බදු ගෙවා ඇති බවට ලිඛිත ලියවිලි ඉදිරිපත් කළ යුතුය. (2024/2025 වර්ෂය)

IV. ලංසුකරු නිෂ්පාදකයකු නොවන්නේ නම් ඒම නිෂ්පාදකයාගේ වෙළඳ නියෝජිතයකු බවට ලංසුකරු පිළිගන්නා බවට වූ සහතිකය ඉදිරිපත් කල යුතුය.

V. වරලත් විගණන ආයතනයකින්, ආයතනයේ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශන (පූර්වාසන්න වසර දෙකකින් එක් වර්ෂයකට අදාළව)

VI. GMP (Good Manufacturing Practices) සහතිකය තිබිය යුතුය.

VII. විජය කුමාරතුංග අනුස්මරණ රෝහලට අදාළ රු.10,080.80ක වටිනාකමින් යුත් ලංසු ඇපකරයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති වාණිජ බැංකුවකින් සීදූව , කොළඹ පාර, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල ලිපිනයෙහි වූ සභාපති විජය කුමාරතුංග අනුස්මරණ රෝහල නමට ලියන ලද ලංසු භාර ගැනීම අවසන් වූ දින සිට දින 119 ක කාලයකට වලංගු වන සේ ලබාගත් ලංසු බැඳුම්කරයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.( 2026.05.27 දින සිට 2026.09.22 දක්වා වලංගු විය යුතුය).

2. ලංසු අයදුම්පත් 2026.05.13. දින සිට 2026.05.27 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 දක්වා සීදූව , කොළඹ පාර, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල ලිපිනයෙහි වූ කාර්යාලයෙන් ලබා ගත හැකිය. ලංසු අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන රු.2000ක ගාස්තුවක් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ **සරප් අංශය** වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපත (මුල් පිටපත) හා ලංසු ලියවිලි ඉල්ලුම් කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.

3. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2026.05.27 දින **පෙ.ව. 10.00** ට පෙර ලැබෙන සේ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ සීදූව , කොළඹ පාර, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩර් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “2026/2027 වර්ෂයේ විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ පිරිසිදු කිරීමේ සේවාව සඳහා අවශ්‍ය වන සේදුම්කාරක හා විශබීජ නාශක රසායනික ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවෙකු සපයා ගැනීම” යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ඉදිරිපත් කරනු ලබන II සහ VII සහතිකවල මුල් පිටපත ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

5. ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

6. **2026.05.27 පෙ.ව.10.00** දක්වා සීදූව , කොළඹ පාර, විජය කුමාරතුංග අනුස්මරණ රෝහල දී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා පරිපාලන නිලධාරි / ගණකාධිකාරි අමතන්න. (දුරකථන අංක 011-2258862-4)

7. ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,

සීදූව